විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/11 - 2024
ඔබේ අංකය / உமது இல. / Your No. } .
දිනය / திகதி / Date } 2025.09.30

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 03/2025**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**විශ්‍රාමිකයින්ට රුපියල් 3,000/-ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාවක් ගෙවීම**

රජයේ සියලුම විශ්‍රාමිකයින් වෙත රුපියල් 3,000/-ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාව 2024 ඔක්තෝබර් මස සිට ගෙවීම සඳහා අංක අමප/24/1992/704/007 හා 2024.10.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

02. 2024 ඔක්තෝම්බර් මස සිට මෙම දීමනාව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ගෙවීම් කරනු ලැබේ.

03. ඉහත දීමනාව පහතින් සඳහන් කර ඇති කොන්දේසිවලට අනුකූලව හිමිගැන්වීමට කටයුතු කරනු ලැබේ.

i. විශ්‍රාම වැටුප් කිහිපයක් ලබන විශ්‍රාමිකයෙකු හට හිමිවනුයේ මසකට රුපියල් 3,000/-ක එක් දීමනාවක් පමණි.

උදා :-

(අ) සිවිල් විශ්‍රාම වැටුප හා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප යන විශ්‍රාම වැටුප් දෙකම යම් විශ්‍රාමිකයකු විසින් ලබා ගන්නා අවස්ථාවක දී සිවිල් විශ්‍රාම වැටුප සඳහා මෙම දීමනාව ගෙවනු ලැබේ.

(ආ) දුබලතා විශ්‍රාම වැටුප හා සේවා විශ්‍රාම වැටුප යන දෙකම යම් විශ්‍රාමිකයකු විසින් ලබා ගන්නා අවස්ථාවක දී සේවා විශ්‍රාම වැටුප සඳහා මෙම දීමනාව ගෙවනු ලැබේ.

(ඇ) එකම දායකයා වෙනුවෙන් යැපීම් දීමනාව හා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප යන දෙකම එක් යැපෙන්නකු විසින් ලබා ගන්නා අවස්ථාවක දී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා මෙම දීමනාව ගෙවනු ලැබේ.

(ඇ) දුබලතා විශ්‍රාම වැටුප පමණක් හෝ යැපීම් දීමනාව පමණක් (යැපීම් දීමනාව විශ්‍රාම වැටුපක් ලෙස සලකන බැවින්) හෝ ලබා ගන්නා තැනැත්තන්ට ද මෙම දීමනාව ගෙවනු ලැබේ.

ii. පුණ්‍යාධාර දීමනාව හා තුවාල දීමනාව සඳහා මෙම රුපියල් 3,000/-ක දීමනාව හිමි නොවේ.

iii. විශ්‍රාම වැටුපක් නොලබන දීමනා පමණක් ලබන තැනැත්තෙකු මෙම රුපියල් 3,000/-ක දීමනාව සඳහා හිමිකම් නොලබයි.

iv. නැවත විවාහයට පත්ව විශ්‍රාම වැටුපෙන් 50%ක් ලබන වැන්දඹුවන්ට හිමි වන්නේ මෙම දීමනාවෙන් 50%ක් පමණි.

v. විශ්‍රාම වැටුපක් ප්‍රතිලාභීන් කිහිප දෙනෙකු වෙත බෙදා ගෙවන විට දී අදාළ ප්‍රතිශතය අනුව මෙම දීමනාව ද අනුපාතිකව බෙදා ගෙවිය යුතු ය.

vi. විදේශගත විශ්‍රාමිකයින් සඳහා ද මෙම දීමනාව හිමි වේ.

vii. 2025.01.01 දින ද සේවයේ යෙදී සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර සේවයෙන් පසු විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත 2025.06.30 දින තෙක් පමණක් විශ්‍රාම වැටුප සමඟ මෙම දීමනාව හිමි වේ. 2025 අයවැය යෝජනා අනුව සංශෝධිත නව වැටුප් පරිමාණයන්හි සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව 2025.07.01 දින සිට විශ්‍රාම වැටුප හිමිගන්වන බැවින් එදින සිට විශ්‍රාම වැටුප සමඟ මෙම දීමනාව හිමි නොවේ.

viii. 2025.04.01 දින සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන විශ්‍රාමිකයින් හට 2025 අයවැය යෝජනා අනුව සංශෝධිත නව වැටුප් පරිමාණයන්හි සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප හිමිගන්වන බැවින් විශ්‍රාම වැටුප සමඟ මෙම දීමනාව හිමි නොවේ.

04. මෙම දීමනාව ඉහත 03 ඡේදයේ සඳහන් කොන්දේසි අනුව පමණක් හිමිගැන්විය යුතු අතර ඉහත කොන්දේසිවලට අනුකූල නොවන පරිදි යම් ගෙවීමක් සිදු කර ඇත්නම් එම ගෙවීම වහාම නතර කළ යුතු ය. වැඩිපුර ගෙවීමක් සිදු ව ඇත්නම් නැවත අයකිරීමට ද කටයුතු කළ යුතු ය.

05. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතියේ පවතින දත්ත මත පදනම්ව මෙම දීමනාව හිමිගැන්වීම සිදු කරන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින විශ්‍රාම වැටුප් ලිපිගොනු අනුව පරීක්ෂා කර බලා ගෙවීම් සිදු කර ඇති ආකාරයේ යම් නිවැරදිවීමක් සිදුවිය යුතු නම් වහාම ඊට අදාළව දත්ත පද්ධතිය තුළ නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතු ය.

06. මෙම දීමනාව හිමි විය යුතු, එහෙත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් දීමනාව ගෙවීම ආරම්භ කර නොමැති විශ්‍රාමිකයෙකු වෙනුවෙන් දීමනාව හිමිගැන්වීම සඳහා Allowances Arrears Reason යටතේ AR ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

07. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව සහිතව මෙම උපදෙස් ලිපිය නිකුත් කරනු ලැබේ.


**චාමින්ද හෙට්ටිආරච්චි**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


**පිටපත් -**

1) ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.ස
3) ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස.
6) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.